දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය සභා බල සීමාව, හා මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩිහේ - නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ මඩිහේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. අබේගුණවර්ධන විසින් පිළියෙල කරන ලද 2009.11.29 දිනැති අංක 542 දරන පිඹුරුපතෙහි ලොට් අංක 01 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන් කරන ඉහත ලොට් අංක 1 ලෙස සඳහන් රණවකගෙ ගෙදරවත්ත නොහොත් කුරක්කන් කොරටුව සහ බාච්චිගේ අරබෙ නමැති ඉඩමට උතුරින් - මඩිහෙ සිට වැලිගම හන්දිය දක්වා වූ මාර්ගයේ පංඥසීල පෙදෙස මගින් සහ එම ඉඩමේම තවත් කොටසක් වූ ලොට් අංක 02 මගින්ද, නැගෙනහිරින් එම ඉඩමේ ම තවත් කොටසක් වූ ලොට් අංක 2 මගින් ද, දකුණින් ඇනාමෙස්තොන්ගේවත්ත නොහොත් කපුගෙදරවත්ත නොහොත් කොනේවත්ත ඉඩම මගින් හා බටහිරින් - මඩිහෙ සිට වැලිගම හන්දිය දක්වා වූ මාර්ගයේ පංඥාසීල පෙදෙස මගින් මායිම්වී ඇති ඉඩම එහි ඇති ගොඩනැගිලි, පස, වගාවන් ඇතුළු සියල්ලත් සමගම මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම 544/73 පත්තිරුවේ ලියාපදිංචි කරන ලද ඉඩමේ විශාලත්වය රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම හතරයි තුනයි තුනකි. (A0, R1, P0.433)

දැනට පවත්නා හෝ මෙතැන් සිට ඉදිරියට වරින් වර අවශ්‍ය විය හැකි නිශ්චල ව පවත්නා පැලෑටි සහ යන්ත්‍රෝපකරණ උපකරණ සවිකිරීම් සහ සේවාවන් සියල්ලම සඳහන් කර ඇති අතර එම ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ හා වායු සමීකරණ උපකරණ, ඉහත සඳහන් ඉඩම් වෙන් කිරීමේ දී ස්ථිරව සවි කර ගත හැකිය.

හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. එල්. එල්. රුවන්තිකා මෙය හමුවේ 2018 ජුනි මස 8 වන දින හා අංක 11 යන ණය උකස් බැඳුම්කරය සඳහා හේවා තොණ්ඩිලේගේ අමරසිරි හා පත්තිනිගේ ආරියවතී යන අය උක්ත දේපළ සඳහා පොරොන්දු වූ පරිදි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත ගෙවීම් පැහැර හැර ඇත.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරන ලද බලය යටතේ, ඉහත සඳහන් කළ දේපළ 2019 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා දින පෙරවරු 10.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දනුම් දෙමි.

දේපළ සඳහා වූ ප්‍රවේශය :- මාතර නගර මධ්‍යයේ සිට ගාලු පාර දිගේ වැලිගම හන්දිය දක්වා කි. මී. 3.5 ක් පමණ ඉදිරියට යන්න. ඉන්පසු වම් පස ඇති මඩිහේ පන්ඥසීහ මාවත දෙසට වමට හැරී මීටර් 350 ක් පමණ ඉදිරියට යන්න. විෂයට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

නිවේදනය සඳහා 2019 සැප්තැම්බර් 20 වන දිනැති රජයේ ගැසට් පත්‍රය සහ 2019 සැප්තැම්බර් 2 වන දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීම් කරන පිළිවෙළ .- සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන බළධරයා වෙත ගෙවිය යුතු පළාත් විකිණීමේ බද්ද වශයෙන් 1% ක මුදල (සියයට එකක්)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන විකිණීමේ මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදලට අදාළ වන බද්ද,
4. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 500
5. විකිණීමේ වියදම් සහ වෙනත් ගාස්තු ඇත්නම්
6. විකිණීමේ කොන්දේසි සඳහා වූ මුද්දර ගාස්තුව

විකුණුම් මිලෙන් ඉතුරු 90% ක මුදල සහ ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ වෙනත් බලධාරියා විසින් අද ාළ වන අවස්ථාවල දී නියම කරනු ලබන ව්‍යවස්ථානුකූල අයකිරීම් තීරු බද්ද, බද්ද හෙවත් ගාස්තු, විකිණීමේ දින සිට දවස් තිහක් ඇතුළත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත සඳහන් නිලධාරියාගෙ න් පරීක්ෂා කර බැලිය හැක.

කළමනාකරු මධ්‍යගත අයකර ගැනීම්, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2448448/ෆැක්ස් අංක 011-2440262.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
පහළ දුටුගැමුණු වීදිය, කොහුවල,
දුරකථන 011-4367467, 11-4367111 aucslk@gmail.com.

10-440

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල මහනුවර සිය ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති සහ ලියාපදිංචි අංක පීවී /3755 දරන 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ටෙලි- පික්ස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

මධ්‍යම පළාතේ මහනුවර මහනගර සභා සීමාව තුළ පේරාදෙණිය පාර කටුකැලේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඩී. ආදිහෙට්ටි විසින් සාදන ලද 2003 මාර්තු 11 වැනි දිනැති අංක 3713 දරන සැලැස්මේ නිරූපනය වන දැන් 185 යනුවෙන් අංක කර ඇති සහ කලින් වරිපනම් අංක 111 ඒ දරන බෙදා වෙන් කරන ලද ඉඩම සහ නිවස ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම බිංදුවයි හතරයි බිංදුවක් (අ. 0 රූ. 0, පර්. 12.040) ක් විශාල, එහි පිහිටි වෙනත් සියලු දේද සමග ඉඩම, ඉහත සඳහන් දේපල 2019 ඔක්තෝබර් මස 28 වන දින පෙරවරු 9.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම.- මහනුවර නගරයේ පිහිටි ඔරලෝසු කණුව වටරවුමේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ඔස්සේ (පේරාදෙණිය පාර) මී. 500 ක පමණ දුරක් ගියවිට ඇති කටුකැලේ ඉන්ධන පිරවුම්හල ද පසුකලවිට වරිපනම් අංක 185 දරන අදාල දේපල මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2017.08.11 වන දින පළ වී ඇති අතර, ලංකාදීප, සහ ඩේලිමිරර් පුවත්පත් වල 2017.08.04 වන දින ද තිනකුරල් පුවත්පතේ 2017.08.08 වන දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1.ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙ වුවහොත් දනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.- ප්‍රධාන කළමනාකාරිණී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු.ක. 011-2456477, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3,විහාර මාවත, කොලොන්නාව,
දු.ක. 011-3068185, 011-2572940

10-444

---

**සෙලාන් බැංකුව පීඑල්සී - වේයන්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වේයන්ගොඩ පදිංචි සේනාදිරි දුමුන්නගේ ප්‍රසන්න සේනාධිර සහ සේනාධීර අතාවුදගේ උදේශිකා එරන්දි යන අය බන්ධනදායීන්/ උකස්කරුවන් වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් සහතික කරන ලද 2014.08.01 දිනැති බැඳුම්කර අංක 552, 2015.03.26 දිනැති 678, 2016.05.25 දිනැති 1026 දෙකම 2017.07.21 දිනැති 1323 සහ 1324 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපල, වර්ෂ 2019 ක් වූ ඔක්තෝබර් මස 29 වන දින පහත සඳහන් කර ඇති වේලාවන්හිදී දේපල පිහිට ස්ථානයේදී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

1 වන වෙන්දේසිය - පෙ.ව. 10.30

බස්නාහිර පළාතේ, අත්තනගල්ල ලියා පදිංචි කිරීමේ කොට්ඨාසය තුල, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරලේ, යටිගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුද්දරගම - 34 ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ, මුද්දරගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. කේ. එන්. තිලකසිරි විසින් සාදන ලද 2008 මැයි මස 23 දිනැති අංක 0440 ඩබ්ලිව් දරන සැලැස්මේ නිරූපනය වන කහටගහවත්ත හෙවත් කහටගහකුරුදු වත්ත නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතරයි දශම බිංදුවයි නමයක් (අ. 0, රූ. 1, පර්. 34.09) ක් විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග, පෙර කී මුද්දරගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. එන්. කන්නන්ගර විසින් සාදන ලද 2004 නොවැම්බර් මස 20 දිනැති අංක 1451/2004 දරන සැලැස්මේ නිරූපනය වන කහටගහවත්ත හෙවත් කහටගහකුරුදු වත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 3.4) විශාල මාර්ග ප්‍රවේශය

මෙය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් හතරම සහතික කරන ලද 2014.08.01 වන දිනැති උකස් බැඳුම්කර අංක 552, 2016.03.26 දිනැති 678, 2016.05.25 දිනැති 1026 සහ 2017.07.21 දිනැති 1324 යටතේ උකස්කරන ලද දේපළ

දේපළට පිවිසීම.- වේයන්ගොඩ නගරයේ සිට වේයන්ගොඩ බාඳුරාගොඩ පාරෙන් 7 km ක් පමණ 7km කණුව දක්වා පැමිණ දකුණට හැරී අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටසින් 30 m පමණ ගියවිට එම පාර කෙලවරට වන්නට මෙම දේපල පිහිටා ඇත.

2 වන වෙන්දේසිය .- ප.ව. 1.00

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, අලුත්කුරු කෝරලේ, දාසියා පත්තුවේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව සහ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විතානමුල්ල 98/4 ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ, මාබෝදලේ සහ විතානමුල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු නලින් හේරත් විසින් සාදන ලද 2005.06.27 දිනැති 2005/202 දරන සැලැස්මේ නිරූපනය වන මාබෝදලේ එස්ටේට් නමැති ඉඩමේ ලොට් 20 බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් දහසයක් (අ. 0, රූ. 0, පර්. 16) ක් විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග

පෙර කී මාබෝදලේ සහ විතානමුල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු නලින් හේරත් විසින් සාදන ලද 2005 මැයි මස 03 සහ 2005 මැයි මස 11 දිනැති අංක 2005/202 දරන සැලැස්මේ නිරූපනය වන මාබෝදලේ එස්ටේට් ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙද ා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහනමයයි දශම දෙකයි දෙකයි (අ. 0, රූ. 0, පර්. 19.22) ක් විශාල මාර්ග ප්‍රවේශය.

මෙය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් සහතික කරන ලද 2017.07.21 වන දිනැති උකස් බැඳුම්කර අංක 1323 යටතේ උකස්කරන ලද දේපල

දේපලට පිවිසීම.- වේයන්ගොඩ නගරයේ සිට වේයන්ගොඩ- මිනුවන්ගොඩ පාරෙන් 3 කි. මී. ක් පමණ දුරින් නයිවල හන්දිය දක්වා පැමිණ දකුණට ඇති නයිවල දිවුලපිටිය පාරෙන් 5 km දුරින් 13 km කණුව දක්වා මඩගම්පිටිය හන්දිය දක්වා පැමිණෙන්න එතැන් සිට ඉදිරියට මීටර් 10 ක් පමණ ගියවිට වම් පසින් වන්නට මෙම දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දන්වීම.- 2019.07.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ලංකාදීප, ඩේලිමිරර් පුවත්පත්හි 2019.07.17 සහ තිනක්කුරල් පුවත්පත් හි 2019.07.15 පළවී ඇත.

ගෙවීම් ක්‍රමය.- වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය :

(1) ගැණුම් මිලෙන් 10%
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 1000
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය

ගැණුම් මිලෙන් 90% ක් වු ඉතිරියද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුව අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. ප්‍රධාන කළමණාකාරිණී - නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90,ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක - 011-2456485, 011-2456479, 011-2456473

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ හෝමාගම,
දු.අ. 071-4318252- 011-2173282

10-446

---

**සෙලාන් බැංකුව පීඑල්සී - වේයන්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

දෙදෙනාම වේයන්ගොඩ පදිංචි ටිකිරියාදුර රවින්ද්‍ර නාලක ද සිල්වා සහ වෙත්තිමුනි නිලන්ති රූපිකා ද සිල්වා යන අය බන්ධනදායීන්/ උකස්කරුවන් වශයෙන්, ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2013.06.17 දිනැති බැඳුම්කර අංක 4934 ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් සහතික කරන ලද 2015.06.30 දිනැති 797 ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ටී. කේ. කළුආරච්චි විසින් සහතික කරන ලද 2018.04.11 දිනැති 1714 ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්.ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් දෙකම සහතික කරන ලද 2014.05.08 දිනැති 495 සහ 2016.10.20 දිනැති 1147 මගින් සෙලාන් බැංකුව පිඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපල, වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 01 වන දින පහත සඳහන් කර ඇති වේලාවන්හිදී දේපල පිහිටි ස්ථානයේදී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1 වන වෙන්දේසිය - පෙ.ව. 9.00

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුන පානදුර තල්පිටි දෙබැද්ද, කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කුඩා වස්කඩුව පිහිටි බලයලත් මිනින්දෝරු පී. අබේපිටිය විසින් සාදන ලද 2012.03.15 දිනැති අංක 4014 සැලැස්මේ නිරූපනය වන බෙලිගහවත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් නමයයි දශම අටයි හයක් (අ.0, රූ. 0, පර්. 9.86) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් දෙකම සහතික කරන ලද 2014.05.08 වන දිනැති උකස් බැඳුම්කර අංක 495 සහ 2016.10.20 දිනැති 1147 යටතේ උකස්කරන ලද දේපළ

දේපළට පිවිසීම.- කළුතර සිට ගාලු පාරෙන් මීටර් 50 ක් ඉදිරියට ගියවිට 38Km වෙනි කණුව දක්වා පැමිණ දකුණු පසින් වන්නට ඇති ශ්‍රී රතනජෝති මාවතට හැරී එම පාරෙන් මීටර් 450 ක් පමණ ගියවිට T හන්දියක් හමුවේ. එතැන් සිට දකුණට ඇති වටවල වත්ත පාරෙන් ගියවිට දකුණු පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

2 වන වෙන්දේසිය .- ප.ව. 2.30

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරලේ දාසියා පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නයිවල 99/1 ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ, නයිවල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිනි විසින් සාදන ලද 2013.02.18 දිනැති අංක 10123 සැලැස්මේ නිරූපනය වන නයිවලවත්ත නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0, රූ. 0 පර්. 12) ක් විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් බ. ඒ. එම්. අයි. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2013.06.17 දිනැති උකස් බැඳුම්කර අංක 4934 ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. ජේ. වෙල්ලප්පිලි විසින් සහතික කරන ලද 2015.06.30 වන දිනැති උකස් බැඳුම්කර අංක 797 ප්‍රසිද්ධ නොතාරිස් ටි. කේ. කළුආරච්චි විසින් සහතික කරන ලද 2018.04.11 දිනැති 1714 යටතේ උකස්කර ලද දේපළ.

දේපළට පිවිසීම.- වේයන්ගොඩ නගරයේ සිට මිනුවන්ගොඩ පාරෙන් කි. මී. 2.50 ක දුරින් නයිවල හතරමං හන්දිය දක්වා පැමිණ තවදුරටත් මීටර් 150 ක් දුරින් ඇති සිංගර් ප්‍රදර්ශණාගාරය දක්වා පැමිණ පළතුරු කඩය අසළින් ඇති බොරලු පාරෙන් හැරී මීටර් 15 ක් පමණ ගියවිට වම් පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දන්වීම්.- 2019.08.23 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ලංකාදීප, ඩේලිමිරර් පුවත්පත්හි 2019.08.26 සහ තිනක්කුරල් පුවත්පත් හි 2019.08.23 පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 1000,
6. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. ප්‍රධාන කළමණාකාරිණී - නීති, සෙලාන් බැංකුව පිඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන 011-2456485, 011-2456479, 011-2456473

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි. හයිලෙවල්පාර,
සර්වෝදය මාවත, පනාගොඩ හෝමාගම,
දු.අ. 071-4318252- 011-2173282

10-447

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ විකිණීමේ නිවේදනය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව කැන්දලන්ද මොණරාගල සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන සිංහ කොන්සෝටියම් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ මොණරාගල පදිංචි ලසිත අබේගුණසේකර යන අය උකස්කරු වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සමන්ති ප්‍රියදර්ශණී විසින් ලියා සහතික කරන ලද අංක 783 සහ 1091 දරන බැදුම්කරයන් මගින් ද,

මොණරාගල සිය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන සිංහසිරි හාඩ්වෙයාර් යන නාමය විලාසය හා අභිධානය යටතේ ඒක පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මොණරාල පදිංචි ලසිත අබේගුණසේකර යන අය උකස්කරු වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සමන්ති ප්‍රියදර්ශණී විසින් ලියා සහතික කරන ලද අංක 601, 610, 612, 781, 829, 990, 992 සහ 1089 දරන බැදුම්කරයන් මගින් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1 වන විකිණීම. - 2019ක් වූ ඔක්තෝබර් මස 29 වැනි දින ප. ව. 2.00 ට

අංක 783 සහ 1091 දරන උකස්කරයන් මගින් උකස් කර ඇති දේපළ

ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික දේපළක් මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මුප්පන ග්‍රාම නිලධාරි වසම මුප්පන ගමේ පිහිටි හුලංන්දඹය වත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. බී. ඉලංගසිංහ විසින් 2012.07.07 වැනි දින සාදන ලද අංක MO/ 9827 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කළ ලොට් අංක 01, 02, 03, 04, 05 සහ 06 නමැති ඉඩම් කොටස් හා එහි තුළ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය (ලොට් 01 රූඩ් 01) (ලොට් 02 පර්චස් 20) (ලොට් 03 පර්චස් 20) (ලොට් 04 පර්චස් 20) (ලොට් 05 පර්චස් 29.20) (ලොට් 06 රූඩ් 01 පර්චස් 15)

ඉහත කී අංක MO/9827 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කළ ලොට් අංක 07 දරන ඉඩම උඩින් යටින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගින් වේ.

දේපළ පිවිසීම. - මොණරාගල බස් නැවතුම් ස්ථානයේ සිට වැල්ලවාය පාරේ කි. මී. 1.3ක් පමණ ගමන් ගත් විට බෝක්කු අංක 250/3 ආසන්නයේ පාරට මායිම්ව වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත. (අදාල දේපළ පරිශ්‍රයේ මහජන බැංකු ප්‍රාදේශීය කාර්යාලය පිහිටා තිබේ.)

2 වන විකිණීම. - 2019 ක් වූ ඔක්තෝබර් මස 29 වැනි දින ප. ව. 2.45 ට

අංක 601, 610, 612, 781, 829, 990, 992 සහ 1089 දරන උකස්කරයන් මගින් උකස් කර ඇති දේපළ

ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික දේපළක් මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මුප්පන ග්‍රාම නිලධාරි වසම මුප්පන ගමේ පිහිටි හුලංනේදාඔය වත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. බී. ඉලංගසිංහ විසින් 2012.07.07 වැනි දින සාදන ලද අංක MO/ 10672 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් අංක 02 නැමති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අක්කර 01 පර්චස් 35.25

දේපළට පිවිසීම. - මොණරාගල බස් නැවතුම් ස්ථානයේ සිට වැල්ලවාය පාරේ කි. මී. 1.2ක් පමණ ගමන් ගත් විට පාරට මායිම්ව වම් පසින් අදාල දේපළ පිහිටා ඇත. (අධිකරණ සංකීර්ණය පසු කළ වහාම)

යෝජනා සම්මුතිය සඳහා 2019.09.12 දින රජයේ ගැසට් පත්‍රය ද 2019.08.30 දින දිවයින, අයිලන්ඩ් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය. - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු.2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය) නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක. 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2 448 448

අයි. ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක :081-2210595/ 071-8446374/ 071-4962449

10-435

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2019 අංක 749

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් නව්ෆල් අබ්දුල් රහ්මාන් මහතා 2018 දෙසැම්බර් මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම් තනතුරේ වැඩබැලීම සඳහා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 සැප්තැම්බර් මස 16 වැනි දින දීය.

10 - 394

## රජයේ නිවේදන

**තැපැල් දෙපාර්තමේන්තුව**

තැපල් කාර්යාල ආඥපනතේ 45 වගන්තිය යටතේ සකස් කරනු ලබන රීතියයි

2016.01.01 වැනි දින සිට 2016.12.31 වැනි දින දක්වා නිකුත් කළ මුදල් ඇණවුම්

මුදල් ඇණවුමක් වලංගු වන්නේ එය නිකුත් කළ මාසයේ අවසන් දින සිට මාස 06ක කාල සීමාවක් සඳහා පමණි. එසේම නිකුත් කළ මාසයේ අවසන් දින සිට අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුමක් නැවත වලංගු කිරීමට හෝ එහි වටිනාකම ආපසු ගෙවීමට හෝ නොහැක. එහෙත් වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුමකට විශේෂ අවස්ථා අනුව සලකා එය නිකුත් කළ මාසයේ අවසන් දිනයේ සිට අවුරුදු දෙකක් දක්වා මුදල් ගෙවීම ගැන සලකා බලනු ලැබේ. එසේ නොවන මුදල් ඇණවුම්වල වටිනාකම රජයේ ආදායමට බැර කරනු ලැබේ.

02. එසේ වුවත් පහත සඳහන් විශේෂ අවස්ථා යටතේ අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුම්වල වටිනාකම අදාළ ගාස්තු අයකර ගැනීමෙන් පසු රජයේ ආදායමෙන් ආපසු ගෙවීම ගැන සලකා බැලිය හැක.

I. මුදල් අණවුම් අධිකරණය වෙත ඉදිරිපත් කර තිබීම.

II. නීතිමය හේතූන් මත ගෙවල් කුලී පාලක මණ්ඩලයක් මගින් මුදල් ඇණවුම රඳවාගෙන තිබීම.

III. මුදල් ඇණවුවේ මුදල ලැබිය යුතු අය විදේශගතවී සිටීම.
(විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.)

IV. මුදල් ලැබිය යුතු අය දීර්ඝකාලීනව දැඩි අයහපත් සෞඛ්‍ය තත්වයකින් පසුවීම. (රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයකින් ඒ බව සනාථ කළ යුතුය)

03. ඉහත 02 (I) හා (II) යටතට අදාළ මුදල් ඇණවුම් මෙම ගැසට් නිවේදනයේ පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ නොහැකි නම් එවැනි මුදල් ඇණවුම් පිළිබඳ විස්තර අදාළ නඩු අංක ආදිය සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත ලිඛිතව එවිය යුතුය. මුදල් ඇණවුම් ඉදිරිපත් කිරීමට අපහසුවන්නේ නම් ඒ බව ලිඛිතව දන්විය යුතුය.

04. එහෙත් දැනට අධිකරණයේ පවතින නඩු වෙනුවෙන් හා වෙනත් නීතිමය අවශ්‍යතාවයන් සඳහා උසාවි නියෝග මගින් රඳවා ඇති මුදල් ඇණවුම්, ගෙවල් කුලී පාලක මණ්ඩලයක නඩු සම්බන්ධයෙන් රඳවා ගතයුතු මුදල් ඇණවුම්, දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් කරගෙන යනු ලබන විනය පරීක්ෂණයක් සඳහා පාදක වූ මුදල් ඇණවුම් මෙමඟින් ආවරණය නොවේ.

05. 2016.01.01 වැනි දින සිට 2016.12.31 වැනි දින දක්වා නිකුත් කරන ලද මුදල් ඇණවුම්වලට අදාළව මෙම නිවේදනය පළකල දින සිට මාස තුනක් සම්පූර්ණ වන දින තෙක් ලැබෙන පැමිණිලි පමණක් සලකා බැලීමට තීරණය කර තිබේ. මෙය සාමාන්‍ය මුදල් ඇණවුම්, විද්‍යුත් මුදල් ඇණවුම්, ෆැක්ස් මුදල් ඇණවුම් හා වටිනාකම ගෙවා භාරගන්නා මුදල් ඇණවුම් සඳහා අදාළ වේ. එහෙත් ඉහත 02 ඡේදයේ සඳහන් අවස්ථා යටතේ වූ මුදල් ඇණවුම්වල වටිනාකම රාජ්‍ය ආදායමට බැර කර ඇත්නම් එම මුදල් ඇණවුම්වල වටිනාකම මුදල් රෙගුලාසිවලට අනුව ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සලකා අදාළ පාර්ශවලට ගෙවීමට කටයුතු කරනු ලැබේ.

06. එබැවින් ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවීම ගැන සලකා බැලීම පිණිස ලිඛිතව කරනු ලබන ඉල්ලීම් හා අදාළ මුදල් ඇණවුම් ද සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත පහත සඳහන් ලිපිනයට මෙම ගැසට් නිවේදනය පළකළ දිට සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බවට ඒ ඒ පළාත් සඳහා, පළාත් පාලන ආයතන, ගෙවල් කුලී පාලක මණ්ඩලය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ ආයතන, බැංකු, පුද්ගලික ආයතන සහ මහජනයා වෙත ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පාලක, මුදල් ඇණවුම් සේවා,
මුදල් ඇණවුම් සේවා අංශය,
නියෝජ්‍ය තැපැල්පති (මධ්‍යම) කාර්යාලය,
තැපැල් සංකීර්ණ ගොඩනැගිල්ල,
තැපැල් දෙපාර්තමේන්තුව,
මහනුවර.

07. ඒ අනුව 2016.01.01 වැනි දින සිට 2016.12.31 වැනි දින දක්වා කාලය තුළ නිකුත් කරන ලද, මෙම නිවේදනයේ දෙවන ඡේදයේ දැක්වෙන කරුණු හතරට අදාළ නොවන වලංගු කාලය ඉකුත්වූ මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවන මෙන්, මෙම ගැසට් නිවේදනය පලකළ දින සිට මාස තුනකට පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාර නොගන්නා බවත් එවැනි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

08. 2016.01.01 වැනි දිනට පෙර නිකුත් කරන ලද කිසිදු මුදල් ඇණවුමක් සඳහා කුමන හේතුවක් මත වුවද කෙරෙන ඉල්ලීම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බව සලකන්න.

එම්. එච්. අබ්දුල් හලීම්,
තැපැල් සේවා හා මුස්ලිම් ආගමික
කටයුතු අමාත්‍ය.

10 - 248

**අධ්‍යාපන අමාත්‍යාංශය**

බප/ගම්/සුසිත සුවසෙත විශේෂ පාසල වෙනත් තැනකට රැගෙන යාම පිළිබඳ නිවේදනයයි

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කෙසෙල්වතුගොඩ ඡන්ද කොට්ඨාසයේ, ගම්පහ අධ්‍යාපන කලාපයේ යක්කල, පොල්හේන පාර, "සමාධි' යන ලිපිනයෙහි පිහිටි "සුසිත සුවසෙත" විශේෂ පාසල 2019.07.19 වැනි දින සිට බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ. ගම්පහ ඡන්ද කොට්ඨාසයේ, ගම්පහ අධ්‍යාපන කලාපයේ, බැන්ඩියමුල්ල, කිඩගම්මුල්ල, හැලකනුවල පාර, "සෙනෙහසේ මැදුර" යන ලිපිනයෙහි ස්ථානගත කරන බව උපකෘත පාසල් ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව දන්වා සිටිමි.

කේ. ඒ. ඩී. පුණ්‍යදාස,
අධ්‍යාපන අධ්‍යක්ෂ
(නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන).

10 - 493

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/89/2018/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් සහාධිපත්‍ය දේපළ සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2019.10.11 වැනි දින සිට 2019.10.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2019.11.01 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/8B/15 පත් ඉරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 337බී, මාළිගාතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වඳුරව පිහිටි 'මාළිගාතැන්න' නමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක ගම්/ප්‍ර/මීරි/316 ප්‍රදාන පත්‍රයේ 1994.03.16 දිනැති අංක ගම් 1367 දරන පිඹුරේ කැබලි අංක 18 දරන ඉඩමට මායිම්,<br><br>උතුරට : කැබලි අංක 17 සහ 19,<br>නැගෙනහිරට : කැබලි අංක 19, 23 සහ 20,<br>දකුණට : කැබලි අංක 20 සහ 09,<br>බස්නාහිරට : කැබලි අංක 09 සහ 17.<br><br>ප්‍රමාණය : හෙක්ටයාර් 0.059. | 01. ජනාධිපති ලේකම් විසින් 1994.03.16 වැනි දින ප්‍රදානය කරන ලද අංක ගම්/ප්‍ර/මීරි 316 දරන දීමනා පත්‍රය.<br><br>02. ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රසේන වීරක්කොඩි විසින් 1997.03.24 වැනි දින ලියා සහතික කරන ලද අංක 11630 දරන පැවරුම් ඔප්පුව. |

10 - 398

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/02/2016/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2019.10.04 වැනි දින සිට 2019.10.18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2019.10.25 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 7452 දරන පත්ඉරුව. | පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු සහ කඩවත්සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, අට්ටවිල්ලුව පිහිටි 'අට්ටවිල්ලු' නමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක ආර් 7452/1964.04.14 වැනි දින දරන දීමනා පත්‍රයේ පිඹුරු අංක 01හි කැබලි අංක 59 දරන ඉඩමට මායිම්,<br><br>උතුරට : පාර,<br>නැගෙනහිරට : කට්ටි අංක 56,<br>දකුණට : කට්ටි අංක 58/61,<br>බස්නාහිරට : කට්ටි අංක 60.<br><br>ප්‍රමාණය : අ. 09, රූ. 03, පර්. 23. | 01. ජනාධිපති ලේකම් විසින් 1996.05.08 වැනි දින ප්‍රදානය කරන ලද අංක ආර් 7452 දරන දීමනා පත්‍රය. |

10 - 399

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/16/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2019.10.11 වැනි දින සිට 2019.10.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2019.11.01 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 639 වෙළුමේ 108 පත්ඉරුව.<br><br>10795 | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තුවේ, සල්පිටි කෝරළේ, නාවල පිහිටි 'අඹගහවත්ත' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඩබ්ලිව්. ඉන්ද්‍රතිස්ස මහතා 1958.05.18 වැනි දින මැන සාදන ලද අංක 2076 දරන පිඹුරේ කැබලි අංක 'බී1බී' සඳහා මායිම්,<br><br>උතුරට : කැබලි අංක BIA සහ අධිනීතිඥ අමරසිංහගේ දෙල්ගහවත්ත,<br>නැගෙනහිරට : හෙට්ටිගේ දොන් හෙන්ඩ්‍රික්ගේ දේපළ,<br>දකුණට : කැබලි අංක B2,<br>බස්නාහිරට : කැබලි අංක BIC (අඩි 10ක් පළල පාරකට වෙන් කිරීම)<br><br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 20. | 01. බී. සමරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1958.06.27 වැනි දින අංක 1409 දරන විකුණුම්කරය.<br><br>02. ඩබ්ලිව්. ඩී. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2001.04.13 වැනි දින අංක දරන තෑගිකරය. |

10 - 396

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/35/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් සහාධිපත්‍ය දේපළ සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුවල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2019.10.11 වැනි දින සිට 2019.10.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොටපොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2019.11.01 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 8524 පත්ඉරුව. | දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, බෙංගමුව ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ, බෙංගමු හි පිහිටි 'මහහේන' නමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක R 8524 1967.08.18 වැනි දිනැති දීමනාපත්‍රයේ අංක F.V. 18 දරන පිඹුරේ කැබලි අංක 390හි අක්කර 05 පර්චස් 07ක ඉඩම. | 01. ලංකා ආණ්ඩුකාරතුමා විසින් 1967.08.18 වැනි දින ප්‍රදානය කරන ලද අංක R 8524 දරන දීමනා පත්‍රය.<br><br>02. 2005.03.07 වැනි දින ප්‍රදානය කරන ලද R 8524 දරන මුදලද අයිතිය සහතික කිරීමේ ලේඛනය. |

10 - 395

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/01/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2019.10.11 වැනි දින සිට 2019.10.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2019.11.01 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1285 වෙළුමේ 283 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, ඇරැව්වල පිහිටි 'මිල්ලගහවත්ත' නමැති ඉඩමට බලයලත් මානක එස්. ඩබ්ලිව්. මාකලන්ද මහතා විසින් 1982.08.26 වැනි දින මැන සාදන ලද අංක 1703 දරන පිඹුරේ ලොට් ඒ සඳහා මායිම්,<br><br>උතුරට : අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද බිම් තීරය.<br>නැගෙනහිරට : ලොට් බී.<br>දකුණට : පී. සුන්දරට අයිති ඉඩම.<br>බස්නාහිරට : එම්. හැරිසන්ට අයිති ඉඩම.<br><br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 33. | 01. එච්. ඒ. එස්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991.10.16 වැනි දින අංක 9834 දරන තෑගිකරය. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1285 වෙළුමේ 281 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තුවේ, සල්පිටි කෝරළේ, ඇරැව්වල පිහිටි 'මිල්ලගහවත්ත' නමැති ඉඩමට බලයලත් මානක එස්. ඩබ්ලිව්. මාකලන්ද මහතා විසින් 1982.08.26 වැනි දින මැන සාදන ලද අංක 1703 දරන පිඹුරේ ලොට් බී සඳහා මායිම්,<br><br>උතුරට : අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද බිම් තීරය.<br>නැගෙනහිරට : ලොට් සී.<br>දකුණට : පී. සුන්දරට අයිති ඉඩම.<br>බස්නාහිරට : ලොට් ඒ.<br><br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 33. | 01. එච්. ඒ. එස්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991.10.16 වැනි දින අංක 9833 දරන තෑගිකරය. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1285 වෙළුමේ 282 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙ පත්තුවේ, සල්පිටි කෝරළේ, ඇරැව්වල පිහිටි 'මිල්ලගහවත්ත' නමැති ඉඩමට බලයලත් මානක එස්. ඩබ්ලිව්. මාකලන්ද මහතා විසින් 1982.08.26 වැනි දින මැන සාදන ලද අංක 1703 දරන පිඹුරේ ලොට් සී සඳහා මායිම්,<br><br>උතුරට : අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද බිම් තීරය.<br>නැගෙනහිරට : මනතුංගට අයිති ඉඩම.<br>දකුණට : මනතුංගට සහ ඩී. පී. සුන්දරට අයිති ඉඩම.<br>බස්නාහිරට : ලොට් බී.<br><br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 33. | 01. එච්. ඒ. එස්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991.10.16 වැනි දින අංක 9835 දරන තෑගිකරය. |

10 - 397

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 127158

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "බිලියන් ටේස්ට්ස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2017.11.10 දින සංස්ථාපිත සමාගමක් වන "බිලියන් ටේස්ට්ස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "බිලියන් ටේස්ට්ස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 304

---

පීවී 87724

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "බසී ෆින්ගර්ස් (පීවීටී)එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.08.17 දින සංස්ථාපිත සමාගමක් වන "බසී ෆින්ගර්ස් (පීවීටී) එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "බසී ෆින්ගර්ස් (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 303

---

පීවී 91863

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සී ලංකා ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2013.04.03" දින සංස්ථාපිත සමාගමක් වන "සී ලංකා ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සී ලංකා ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 302

---

පීවී 90563

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සීමාසහිත මොණරවිල වෙදගෙදර (පෞද්ගලික) සමාගම" හි නම කපා හැරීමේ දැන්වීම.

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2013.01.17" දින සංස්ථාපිත සමාගමක් වන "සීමාසහිත මොණරවිල වෙදගෙදර (පෞද්ගලික) සමාගම" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සීමාසහිත මොණරවිල වෙදගෙදර (පෞද්ගලික) සමාගම" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 301

---

පීවී 90203

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සදෙස ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2012.12.28" දින සංස්ථාපිත සමාගමක් වන "සදෙස ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සදෙස ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 300

---

පීවී 87712

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "පින්ක් ලෝටස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2012.08.16" දින සංස්ථාපිත සමාගමක් වන "පින්ක් ලෝටස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "පින්ක් ලෝටස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 299

---

පීවී 101663

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සිටි බෙඩ්ස් (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2014.10.23" දින සංස්ථාපිත සමාගමක් වන "සිටි බෙඩ්ස් (පීවීටී) එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සිටි බෙඩ්ස් (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 298

---

පීවී 80242

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එම් එස් එල් කම්පියුටර් බියුරෝ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.07.25 දින සංස්ථාපිත සමාගමක් වන "එම් එස් එල් කම්පියුටර් බියුරෝ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "එම් එස් එල් කම්පියුටර් බියුරෝ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 297

---

පීවී 68018

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "බොක්ස් - ඕ - නූඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2009.06.09" දින සංස්ථාපිත සමාගමක් වන "බොක්ස් - ඕ - නූඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "බොක්ස් - ඕ - නූඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 305

---

පීවී 70996

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "වර්ල්ඩ් ඔෆ් ඊ ආර් පී ලංකා (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2010.02.10" දින සංස්ථාපිත සමාගමක් වන "වර්ල්ඩ් ඔෆ් ඊ ආර් පී ලංකා (පීවීටී) එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "වර්ල්ඩ් ඔෆ් ඊ ආර් පී ලංකා (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 306

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුදා දිනට පෙර දැනුම් දිය යුතුය.**

**I කොටස : I ඡේදය යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2019.10.11 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk